# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1812/1 - 2013 මැයි මස 27 වැනි සඳුදා - 2013.05.27

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

ඇමුණුම 01

එල්.ඩී-බී........2013

**විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත**

(112 වැනි අධිකාරය වූ) විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 7 වැනි වගන්තිය සමග කියවිය යුතු, එහි 51 වැනි වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද රීතිය.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනවිරත්න,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය.

2013 මැයි මස 15 වැනි දින,
කොළඹ දී ය.

රීතිය

2004 දෙසැම්බර් මස 16 වැනි දින අංක 1371/25 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් අවසන් වරට සංශෝධිත පරිදි වූ, 1914 සැප්තැම්බර් මස 18 වැනි දින අංක 6662 දරන ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ විවාහ ලියාපදිංචි කිරීමේ රීති, එහි උපලේඛනය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :

**උපලේඛනය**

| *I තීරය* | *II තීරය* <br> *රු. ශත* |
|---|---|
| (1) පිටපතක් සඳහා ඉල්ලුම් කිරීමේ දී ලේඛන සෝදිසි කිරීමක් අවශ්‍ය නොවන අවස්ථාවක, සහතික කළ පිටපතක් හෝ උධෘතයක් හෝ ලියාපදිංචි නොකිරීමේ සහතිකයක් නිකුත් කිරීම සඳහා | 100.00 |
| (2) පිටපතක් සඳහා ඉල්ලුම් කිරීමේ දී අවුරුදු 02කට නොවැඩි කාලයක් සඳහා ලේඛන සෝදිසි කිරීමක් අවශ්‍ය වන අවස්ථාවක, සහතික කළ පිටපතක් හෝ උධෘතයක් හෝ ලියාපදිංචි නොකිරීමේ සහතිකයක් හෝ නිකුත් කිරීම සඳහා | 200.00 |

06 - 165/1


1A - G 017697 — 345 (2013/05)

*සැ. යු.- අති විශේෂ ගැසට් අංක 1811/1 කාණ්ඩය අංක 1811/18 න් අවසන් වේ.*

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඇමුණුම 02

එල්.ඩී.බී./.......2013

**(113 වන අධිකාරය වූ) උඩරට විවාහ හා දික්කසාද පනත**

(113 වන අධිකාරය වූ) උඩරට විවාහ හා දික්කසාද පනතේ 16, 19, 22, 23, 34, 54 සහ 56 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එහි 47 වන වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ රීතිය.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනවිරත්න,,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය.

2013 මැයි මස 15 වැනි දින,
කොළඹ දී ය.

රීතිය

1. මෙම රීති 2013 උඩරට විවාහ හා දික්කසාද (ගාස්තු) රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති, ඉහත පනත යටතේ වන ගාස්තු, අනුරූප සටහනේ II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති තැනැත්තන් විසින්, එම සටහනේ ම III වන තීරයේ සඳහන් නිශ්චිතව දක්වා ඇති යම් ප්‍රමාණයන්ගෙන් ගෙවිය යුතුය.

3. (1) මේ පනත යටතේ ගාස්තු හෝ වෙනත් යම් ගෙවීම්වලට අදාල වන්නා වූ 47 වන වගන්තිය යටතේ සාදනු ලැබ, කළින් කළ සංශෝධිත පරිදි වූ, 1954 ජූලි මස 16 වැනි දින අංක 10693 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ, රීති මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

(2) 1 වන ඡේදය යටතේ පරිච්ඡින්න කරනු ලබන රීති යටතේ කරන ලද යම් ක්‍රියාවක් හෝ දෙයක් සියලු කාර්ය සඳහා වලංගු සහ බලාත්මක ලෙස සලකනු ලැබිය යුතුය.

**පළමුවන උපලේඛනය**

***ගාස්තු (3 වන රීතිය)***

| *I වන තීරය* *කාරණය* | *II තීරය* | *III තීරය* *ගෙවිය යුතු මුදල රු. ශත* |
|---|---|---|
| 1. 16 වන වගන්තියේ (1) සහ (2) වන උපවගන්ති යටතේ කොට්ඨාශ රෙජිස්ට්‍රාර්වරයෙකු වෙත දෙනු ලබන විවාහ දැන්වීමකට ගාස්තු - | විවාහ දැන්වීම භාර දෙන පක්ෂය | 100 00 |
| 2. 16 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ විවාහ දැන්වීමකට ගාස්තු - | විවාහ දැන්වීම භාර දෙන පක්ෂය | 100 00 |
| 3. 16 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ විවාහ දැන්වීමකට ගාස්තු - | විවාහ දැන්වීම භාර දෙන පක්ෂය | 100 00 |
| 4. 16 වන වගන්තිය යටතේ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයෙකුට හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයෙකුට දෙන ලද විවාහ දැන්වීමකට ගාස්තු - | විවාහ දැන්වීම භාර දෙන පක්ෂය | 100 00 |
| 5. 24 වන වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් තැනට තම කාර්යාලය නොවන ස්ථානයක දී විවාහයක් සිදුකර ලියාපදිංචි කරවා ගැනීම සඳහා වන ඉල්ලීමකට ගාස්තු - | ඉල්ලීම කරන පක්ෂය | 3,500 00 |
| 6. 34 වගන්තිය යටතේ විවාහයක් අවලංගු කිරීමට කරන ලද ඉල්ලීම් පත්‍රයක් සම්බන්ධයෙන් දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් කරන ලද නියෝගයකට එරෙහිව ගන්නා ඇපැල් පෙත්සමකට ගාස්තු - | ඇපැල් ගන්නා තැනැත්තා | 100 00 |

| *I වන තීරය* *කාරණය* | *II තීරය* | *III තීරය* *ගෙවිය යුතු මුදල* *රු. ශත* |
|---|---|---|
| 7. ලේඛන සෝදිසි කිරීමක් අවශ්‍ය නොවන අවස්ථාවක 56 වන වගන්තිය යටතේ විවාහයක් හෝ දික්කසාදයක් ලියාපදිංචි කිරීමේ සටහනක සහතික කළ පිටපතක් සඳහා හෝ ලියාපදිංචි නොකිරීමේ සහතිකයක් සඳහා වූ ලිඛිත ඉල්ලුම්පත්‍රයක් සඳහා ගාස්තු - | ඉල්ලුම්කරු | 100 00 |
| 8. අවුරුදු 02ක් නොඉක්මවන කාල පරිච්ඡේදයක ලේඛන සෙවීමක් අවශ්‍ය වන අවස්ථාවක 56 වන වගන්තිය යටතේ විවාහයක් හෝ දික්කසාදයක් ලියාපදිංචි කිරීමේ සටහනක සහතික කළ පිටපතක් සඳහා හෝ ලියා පදිංචි නොකිරීමේ සහතිකයක් සඳහා වූ ලිඛිත ඉල්ලුම්පත්‍රයක් සඳහා ගාස්තු - | ඉල්ලුම්කරු | 200 00 |
| 9. 54 වන වගන්තිය යටතේ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයෙකු විසින් උඩරට විවාහයක් සිදු කිරීම සහ ලියාපදිංචි කිරීම සඳහා වූ ගාස්තුව - | | |
| (අ) ඔහුගේ කාර්යාලයේ දී | ඉල්ලුම්කරු | 750 00 |
| (ආ) ඔහුගේ කාර්යාලයේ පිටත යම් බලයලත් ස්ථානයක | ඉල්ලුම්කරු | 1,500 00 |
| 10. 54 වන වගන්තිය යටතේ කොට්ඨාස රෙජිස්ට්‍රාර්වරයෙකු විසින් උඩරට විවාහයක් සිදු කිරීම සහ ලියාපදිංචි කිරීම සඳහා වූ ගාස්තුව | | |
| (අ) ඔහුගේ කාර්යාලයේ දී | ඉල්ලුම්කරු | 750 00 |
| (ආ) ඔහුගේ කාර්යාලයේ පිටත යම් බලයලත් ස්ථානයක | ඉල්ලුම්කරු | 1,500 00 |

06 - 165/2

---

ඇමුණුම 03 (i).

එල්.ඩී.බී./.......2013

**මුස්ලිම් විවාහ හා දික්කසාද පනත**

(115 වන අධිකාරය වූ) මුස්ලිම් විවාහ දික්කසාද පනතේ 94 වන වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියෝග.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනවිරත්න,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය.

2013 මැයි මස 15 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2004 දෙසැම්බර් 16 වැනි දින අංක 1371/25 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් අවසන් වරට සංශෝධිත පරිදි වූ, 1954 ජූලි මස 16 වැනි දින අංක 10693 දරන ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ, මුස්ලිම් විවාහ දික්කසාද නියෝග මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ.

**'අ' උපලේඛනය**

| *I තීරය* | *II තීරය* *රු. ශත* |
|---|---|
| 3. එක් ප්‍රදේශයක රෙජිස්ට්‍රාර්වරයෙකුට වෙනත් ප්‍රදේශයක විවාහයක් ලියාපදිංචි කිරීමට අවසරය දී මේ ලිපිය සඳහා ගාස්තු - | 3,500 00 |
| 4. මනාලයා විසින් 18(1) වැනි වගන්තිය යටතේ කළ යුතු ප්‍රකාශය සඳහා ගාස්තු - | 100 00 |
| 5. මනාලියගේ වාලි විසින් 18(1) වැනි වගන්තිය යටතේ කළ යුතු ප්‍රකාශය සඳහා ගාස්තු - | 100 00 |

**'අ' උපලේඛනය (සම්බන්ධිතයි)**

| | *I තීරය* | *II තීරය* රු. ශත |
|---|---|---|
| 19. | ඉල්ලීම අනුව ලේඛන සෝදිසි කිරීමක් අවශ්‍ය නොවන විට, විවාහ හෝ දික්කසාද සටහනක හෝ වෙනත් යම් සටහනක සහතික කළ පිටපතක් හෝ ලියාපදිංචි නොකිරීමේ සහතිකයක් හෝ නිකුත් කිරීම සඳහා | 100.00 |
| 20 | ඉල්ලුම් පත්‍රය අනුව අවුරුදු 02ක් නොඉක්මවන කාලසීමාවක් සඳහා ලේඛන සෝදිසි කිරීමක් අවශ්‍ය වන අවස්ථාවක, විවාහ හෝ දික්කසාද සටහනක හෝ වෙනත් යම් සටහනක සහතික කළ පිටපතක් හෝ ලියාපදිංචි නොකිරීමේ සහතිකයක් හෝ නිකුත් කිරීම සඳහා | 200.00 |

ඇමුණුම 03 (ii)

1. එහි 'ඇ' උපලේඛනය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්

*'ඇ' උපලේඛනය*

*රෙජිස්ට්‍රාර්වරයෙකුට ගෙවිය යුතු ගාස්තු*

| *I තීරය* ගෙවිය යුතු | *II තීරය* කාරණය | *III තීරය* මුදල රු. ශත |
|---|---|---|
| මනාලයා | විවාහයක් ලියාපදිංචි කිරීම | 1,500.00 |

06 - 165/3

---

ඇමුණුම 04

එල්.ඩී.බී./.......2013

**උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනත**

(110 වන අධිකාරය වූ) උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 69 වන වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ රීතිය.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනවිරත්න,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය.

2013 මැයි මස 15 වැනි දින,
කොළඹ දී ය.

රීතිය

2004 දෙසැම්බර් 16 වැනි දින අංක 1371/25 දරන *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් අවසන් වරට සංශෝධිත වූ පරිදි වූ, 1954 ජූලි මස 16 වැනි දින අංක 10693 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලද 1953 උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රීති, එහි තුන්වන උපලේඛනය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කිරීමෙන් මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ.

**තුන්වන උපලේඛනය**

***ගාස්තු (37 වන රීතිය)***

| | *I තීරය* | *II තීරය* රු. ශත |
|---|---|---|
| (1) | පිටපතක් සඳහා ඉල්ලුම් කිරීමේ දී ලේඛන සෝදිසි කිරීමක් අවශ්‍ය නොවන අවස්ථාවක, සහතික කළ පිටපතක් හෝ උධෘතයක් හෝ ලියාපදිංචි නොකිරීමේ සහතිකයක් නිකුත් කිරීම සඳහා | 100.00 |
| (2) | පිටපතක් සඳහා ඉල්ලුම් කිරීමේ දී අවුරුදු 02කට නොවැඩි කාලයක් සඳහා ලේඛන සෝදිසි කිරීමක් අවශ්‍ය වන අවස්ථාවක, සහතික කළ පිටපතක් හෝ උධෘතයක් හෝ ලියාපදිංචි නොකිරීමේ සහතිකයක් හෝ නිකුත් කිරීම සඳහා | 200.00 |

06 - 165/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.